# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 40/5 — 1973 ජනවාරි 01 වැනි සඳුදා — 1973.01.01

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලද)


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

එල්පීඩී/සී/4/(ඊ)/14

### සුළු නගර සභා ආඥාපනත

#### 183 වන වගන්තිය යටතේ ආඥාව

1968 අංක 42 දරණ පනතින් සංශෝධනය කරන ලද (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 183 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, ඉහත කී වගන්තිය යටතේ මාවනැල්ල නගරය සම්බන්ධයෙන් පනවනු ලැබ, 1971 මාර්තු 21 වැනි දින අංක 14,950/4 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවේ අන්තිම ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් 1973 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එම ආඥාව මෙයින් සංශෝධනය කරමි :—

" (ආ) ඒ නගරය වෙනුවට එකී ආඥාපනත යටතේ අලුත් සුළු නගර සභාවක්, සංස්ථාපනය කැරෙන තුරු මාවනැල්ල නගරයේ කටයුතු පාලනය කිරීම පිණිස ද, ඒ කාර්යය සඳහා එකී ආඥාපනත යටතේ සුළු නගර සභාවක බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ යුතුකම් ඉටු කිරීම පිණිස ද විශේෂ කොමසාරිස්වරයා වශයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් හෙලකුමාරගේ පැරකුම් විජේසිංහ මහතා පත් කරමි. "

ෆීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1972 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දීය.

1—308

---

එල්පීඩී/සී/4/(ඩී) 1/2.

### ගම්සභා ආඥාපනත

#### 54 වැනි වගන්තිය යටතේ ආඥාව

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 54 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම ඉහත කී වගන්තිය යටතේ හංවැල්ල පේරුව ගම් ප්‍රදේශය සම්බන්ධයෙන් පනවනු ලැබූ 1971 ජූලි 5 දින අංක 14,965/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවේ අන්තිම ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් 1973 ජනවාරි මස 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි එය මෙයින් සංශෝධනය කරමි :—

" (ආ) ඒ ගම්ප්‍රදේශය සඳහා අලුත් ගම්සභාවක් තෝරා පත්කර ගන්නාතුරු ඒ ගම්ප්‍රදේශයේ කටයුතු පරිපාලනය කරන ලෙස පාදුක්ක, හොරගල දොන් ප්‍රැන්සිස් වැලිකල මහතා පත් කරමි. "

ෆීf. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති

1972 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දීය.
1—307

---

### ගම්පොල නගරය

#### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ගම්පොල නගරය සඳහා වූ විශේෂ කොමසාරිස් විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරනු ලැබ, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව, එකී වගන්තියේ (2) වන උප වගන්තිය ප්‍රකාර පළ කරනු ලැබේ.

1 A—ඉක් 18601—5,900 (72/12)

## යෝජනාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, ගම්පොල නගරය සඳහා වූ විශේෂ කොමසාරිස් වරයා විසින් එම නගරයේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයේ පැවැත්වෙන (එම ආඥපනතෙහි අර්ථ නිරූපනය කරන ලද පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අය කෙරෙන සියළුම ගෙවීම් වලින් 1957 ජනවාරි 25 වැනි දින අංක 11,053 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මුතියෙන් එබඳු ගෙවීම් සඳහා පනවා අය කරන ලද බද්ද වෙනුවට මෙහි පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව වූ බද්දක් 1973 ජනවාරි මස 1 වැනි දින සිට, මෙයින් පනවා අය කරනු ලැබේ.

ගෙවන මුදල

| බදු ප්‍රමාණය හැර ඇතුළුවීමේ ගාස්තුව | බදු ප්‍රමාණය රු. ශ. |
|---|---|
| (1) ශත 19 ට වැඩිවන නමුත් ශත 39 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 05 |
| (2) ශත 39 ට වැඩිවන නමුත් ශත 59 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 10 |
| (3) ශත 59 ට වැඩිවන නමුත් ශත 79 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 15 |
| (4) ශත 79 ට වැඩිවන නමුත් ශත 99 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 20 |
| (5) ශත 99 ට වැඩිවන නමුත් රු. 1.19 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 25 |
| (6) රු. 1.19 ට වැඩිවන නමුත් රු. 1.39 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 30 |
| (7) රු. 1.39 ට වැඩිවන නමුත් රු. 1.59 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 35 |
| (8) රු. 1.59 ට වැඩිවන නමුත් රු. 1.79 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 40 |
| (9) රු. 1.79 ට වැඩිවන නමුත් රු. 1.99 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 45 |
| (10) රු. 1.99 ට වැඩිවන නමුත් රු. 2.19 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 50 |
| (11) රු. 2.19 ට වැඩිවන නමුත් රු. 2.39 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 55 |
| (12) රු. 2.39 ට වැඩිවන නමුත් රු. 2.59 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 60 |
| (13) රු. 2.59 ට වැඩිවන නමුත් රු. 2.79 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 65 |
| (14) රු. 2.79 ට වැඩිවන නමුත් රු. 2.99 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 70 |
| (15) රු. 2.99 ට වැඩිවන නමුත් රු. 3.49 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 75 |
| (16) රු. 3.49 ට වැඩිවන නමුත් රු. 3.99 ට වැඩි නොවන විට ... ... ... ... ... | 0 85 |
| (17) රු. 3.99ට වැඩිවන නමුත් රු. 4.99 ට වැඩි නොවන විට ... ... ... ... ... | 1 00 |
| (18) රු. 5.00 ක් වන කල්හි හෝ රු. 5 ට වැඩිවන කල්හි | |
| (i) පළමුවන රු. 5 ට ... ... ... ... ... ... ... | 1 25 |
| (ii) ඊට වැඩිවන සෑම අමතර රු. 1 ට ... ... ... ... ... ... | 0 25 |

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 26 දින,
කොළඹ දීය.

1—306

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.